ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 ජූලි 24 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 ජූලි**

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය 2013 මැයි මාසයේ පැවති සියයට 7.3 සිට 2013 ජූනි මාසයේ දී සියයට 6.8 දක්වා අඩු විය. මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) එය හඳුන්වාදීමෙන් පසුව පැවති අවම අගය වාර්තා කරමින් 2013 ජූනි මාසයේ දී තවදුරටත් අඩු විය. මූලික උද්ධමනය 2013 මැයි මස පැවති සියයට 5.7 සිට 2013 ජූනි මාසයේ දී සියයට 4.3 දක්වා අඩු විය. හිතකර උද්ධමන අපේක්ෂාවන් පැවතීම, සැපයුම් අංශයේ වැඩිදියුණුවීම් සහ ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනාත්මක පීඩනයන් නොමැති වීම නිසා වසරේ ඉතිරි කාලසීමාව තුළ දී උද්ධමනය අවම ඍතුමය විචලනයන්ට යටත්ව තනි අංකයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතරම, මෑතකදී ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පදනම් අංක 200 කින් අඩු කිරීම, 2012 දෙසැම්බර් මාසයේ සිට ආරම්භ කරන ලද මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාවලියට තවදුරටත් දායකත්වය සැපයූ අතරම එය ආර්ථික වර්ධන ගම්‍යතාවයට උපකාරීවීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ වෙත තවදුරටත් උත්තේජකයන් ලබා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතික මෙන්ම ප්‍රධාන වාණිජ බැංකුවල කෙටිකාලීන ණය පොලී අනුපාතික සහ තැන්පතු පොලී අනුපාතිකවල පහළ යාමක් දක්නට ලැබුණි. පෞද්ගලික අංශයට ලබාදෙන දිගුකාලීන ණය පහසුකම් සඳහා වන පොලී අනුපාතික ද ඉදිරි මාසවලදී අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්තන ගිණුම වෙත වූ ලැබීම් මෙන්ම රජයේ සුරැකුම්පත්වල විදේශීය ආයෝජන, වාණිජ බැංකු සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ලැබීම් ඉහළ යාම විදේශීය අංශයේ ස්ථායීතාව වර්ධනය කිරීමට උපකාරී විය. මීට අමතරව, රටෙහි ශක්තිමත් ආර්ථික අපේක්ෂාවන්ට මගපෙන්වමින් වෙළෙඳ ශේෂය තවදුරටත් අඩු වූ අතර දේශීය වෙළෙඳාමද වර්ධනය වීමේ සලකුණු පෙන්නුම් කරන ලදී. කෙසේවෙතත්, සංශෝධනය කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගෝලීය ආර්ථික පෙරදැක්මට අනුව, දියුණු ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂිත මට්ටමට වඩා දුර්වල මට්ටමක පවතිනු ඇතැයි වන අපේක්ෂාවන්, විදේශ අංශයෙන් වන ඉල්ලුම අඩුවීමට බලපෑම් කළ හැකි බැවින් ඉදිරි මාසවලදී ඒ පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

2012 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වූ මුදල් ප්‍රතිපත්ති උත්තේජකයන්ට ප්‍රතිචාර දක්වමින් 2013 මැයි මාසය තුළ දී පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය වර්ධනය විය. පෞද්ගලික අංශයට ලබාදුන් ණය නිරපේක්ෂ අගය අනුව අප්‍රේල් මාසයේ පැවැති රුපියල් බිලියන 7.6 සිට 2013 මැයි මාසයේ දී රුපියල් බිලියන 18.3 කින් වර්ධනය විය. මේ අතරම, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල්හි ($M_{2b}$) වර්ධනය අප්‍රේල් මාසයේ පැවති සියයට 15.2 සිට 2013 මැයි මාසයේ දී සියයට 16.3 දක්වා ඉහළ ගියේය. අපේක්ෂිත පරිදි, 2013 මැයි මාසයේ දී රාජ්‍ය අංශයට ලබාදුන් ණය රුපියල් බිලියන 6.2 කින් පමණ අඩු විය. රාජ්‍ය අංශය වෙත වූ ණය වර්ධනය අඩුවීම සහ පියවිය යුතු ණයවලින් කොටසක් පියවීම නිසා ප්‍රධාන රාජ්‍ය සංස්ථා විසින් ණය ලබාගැනීම පහළයාම, පරිපාලිත මිල ගණන්හි සිදුකරන ලද සංශෝධනයන් නිසා ලැබුණු ආදායම ඉහළයාම මෙන්ම හිතකර කාලගුණික තත්ත්වයන් නිසා තාප විදුලිබලය ජනනය කිරීම සඳහා ඉන්ධන භාවිතය අඩුවීම මෙම අඩුවීම සඳහා උපකාරී විය. රාජ්‍ය අංශයෙහි කාර්යසාධනය තවදුරටත් වැඩිදියුණුවීම තුළින් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා අමතර උත්තේජකයන් ලබාදීම සඳහා බැංකු අංශයෙන් අරමුදල් මුදාහැරීමට අපේක්ෂා කෙරේ.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2013 ජූලි මස 23 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසුයැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර ඒ අනුව, මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.00 සහ සියයට 9.00 ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ඉදිරියට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.